# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**ගණිතය** **6 ශ්‍රේණිය**

විභාග අංකය :.................................................... කාලය පැය 02 යි

### I කොටස

★ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

01. 

රූප සටහනේ වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයේ අක්ෂරය ලියන්න.

02. 8675445 යන සංඛ්‍යාවේ 8න් නිරූපණය වන අගය ලියන්න.

03. $225 + 328 + 10012$ සුළු කරන්න.

04. පාසල් පුස්තකාලයකට පොත් 24 බැගින් පොත් 600ක් පාසල් කීයකට බෙදිය හැකිද ?

05.  මෙම කෝණය හඳුන්වන නාමය කුමක් ද ?

06.

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 4 | 25 |
| + | 2 | 45 |

සුළු කරන්න.

07. -2 , +5 , -3 , 0 , +2 යන නිඛිල සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.

08. 84 ආසන්න 10ට වටයන්න.

09. දමිත් පෙ.ව. 11.30ට ගමනක් යාමට පිටත් වීය. ගමන අවසන් වූ වේලාව ප.ව. 3.00 වේ. ගමනට ගත වූ කාලය කොපමණ ද ?

10. අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් කවර භාගයක් ද ?



11. ඊසාන දිශාවට මුහුණලා සිටින අයකුගේ දකුණු අත එල්ලවන දිශාව වනුයේ කුමන දිශාව ද ?

12. 923 ÷ 100 හි ලබ්ධිය හා ශේෂය සොයන්න.

13. ඇපල් ගෙඩියක් රු. 50 බැගින් ඇපල් ගෙඩි 20 ක මිල කීයද ?

14. මෙම සෘජුකෝණාස්‍රයෙන් B ත්‍රිකෝණය ඉවත් කළ විට ලැබෙන A තල රූපය හඳුන්වන නම කුමක් ද ?




15. $\frac{37}{100}$ භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

16. 0.22 , 2.22 , 0.02 දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.

17. 14 සිට 21 දක්වා ඇති ප්‍රථමක සංඛ්‍යා ලියන්න.

18. සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.




19. මෙම කාණ්ඩයට අයත් විශේෂ පොදු ලක්ෂණය කුමක් ද ?




20. 200000 මෙම සංඛ්‍යාව සාමාන්‍ය ව්‍යවහාරයේ දී හඳුන්වන නම කුමක් ද ?

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

★ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් තෝරා ගෙන ඔබ විසින් සපයාගනු ලබන කඩදාසිවල පිළිතුරු සපයන්න.

★ පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද ලැබේ.

---

01. (a) ඔබ ඔබේ පන්තියේ ගුරුතුමා/ගුරුතුමිය සමග කළ ගණිත පියමග "Math Trail" සිහිපත් කරන්න.

(I) එහිදී ඔබට ලබා දුන් උපදෙස් 2 ක් ලියන්න. (ල. 2)

(II) එහිදී ඔබට අදාළ වූ ස්ථානයට ඔබ රැගෙන ගියේ මොනවා ද ? (ල. 2)

(III) ඔබේ කණ්ඩායමේ එක් එක් කාණ්ඩයට සුදුසු යැයි යෝජනා කළ නම් මොනවා ද ? (ල. 2)

(IV) එම නම් යෙදීමට හේතුව පැහැදිලිව ලියා දක්වන්න. (ල. 2)

(b) ශිෂ්‍ය කණ්ඩායමක් ගොනුකරගත් වාහනවල නම් සමූහයක් පහත දක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| බසය | නැව | බෝට්ටුව | ලොරිය | ත්‍රී රෝද රථය |
| යතුරු පැදිය | ජෙට් යානය | හෙලිකොප්ටරය | | රුවල් බෝට්ටුව |

(I) ඉහත කොටුව තුළ දක්වා ඇති වාහන ඒවායෙහි පොදු ලක්ෂණ අනුව A, B, C යනුවෙන් තුන්කොටසකට වෙන් කරන්න.




(ල. 3)

(II) ඔබ විසින් වෙන් කරන ලද A, B, C කාණ්ඩවලට සුදුසු නමක් බැගින් සඳහන් කරන්න.

A ........................ B ........................ C ........................ (ල. 3)

(III) අහස් යානය මෙම කාණ්ඩ තුනෙන් කුමන කාණ්ඩයට අයත් වන්නේ ද ?
ඊට හේතුව කුමක් ද ? (ල. 2)

02. (I) පහත භාග අරෝහණ පටිපාටියට ලියන්න.

$\frac{1}{7}$ , $\frac{1}{3}$ , $\frac{1}{2}$ , $\frac{1}{9}$ (ල. 1)

(II) '>' සහ '<' අතරින් සුදුසු සංකේතය යොදා ලියන්න.

(a) $\frac{1}{2}$ ....... $\frac{7}{11}$ (ල. 1) (b) $\frac{5}{6}$ ....... $\frac{1}{3}$ (ල. 1)

(III) අගය සොයන්න.

(a) $\frac{3}{7} + \frac{1}{7}$ (ල. 2) (b) $\frac{5}{12} + \frac{1}{12}$ (ල. 2)

(IV) අගය සොයන්න.

(a) $\frac{1}{7} + \frac{4}{21}$ (ල. 2) (b) $\frac{3}{4} - \frac{5}{12}$ (ල. 2)

03. (I) පහත තල රූප අඳින්න.

ත්‍රපීසියම (ල. 1) සෘජුකෝණාස්‍රය (ල. 1)

(II) 0 . 32 යන දශම සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න. (ල. 1)

(III) $\frac{8}{10}$ දශම ආකාරයෙන් ලියන්න. (ල. 2)

(IV) සුළු කරන්න.

(a) 18.35 + 32.26 (ල. 2) (b) 7 . 35 - 5 . 27 (ල. 2)

(V) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස් කරන්න.

2.25 , 3.75 , 1.25 , 4.33 (ල. 2)

04. (a) (I) ඔබ හඳුනාගත් සංඛ්‍යා වර්ග 3ක් ලියන්න. (ල. 3)

(II) පහත සඳහන් රටාව නිරීක්ෂණය කරමින් පිළිතුරු සපයන්න. (ල. 1)



(i) (ii) (iii) (iv) ....................

(III) $1 = 1 \times 1$

$4 = 2 \times 2$

....................

....................

.................... රටාව සම්පූර්ණ කරන්න. (ල. 3)

(IV) ඔබ (II) හිදී පිළිතුර ලෙස ඇඳි රටාවේ ඇති කුඩා සමචතුරස්‍ර සංඛ්‍යාව කොපමණ ද ? (ල. 1)

(b) (I) ඕනෑම සංඛ්‍යාවක සාධකයක් වන සංඛ්‍යාව සඳහන් කරන්න. (ල. 1)

(II) සාධක දෙකක් පමණක් ඇති සංඛ්‍යා හඳුන්වන විශේෂ නම කුමක් ද ? (ල. 1)

(III) 10 ට අඩු සාධක දෙකක් පමණක් ඇති සංඛ්‍යා ලියන්න. (ල. 1)

05. (a) පහත සඳහන් රූපවල පරිමිතිය සොයන්න.

(I)




(ල. 2)

(II)




(ල. 1)

(III)




(ල. 2)

(IV)




(ල. 1)

(b)




(I) රූපයේ දැක්වෙන්නේ A හා B ජල ටැංකි දෙකකි. වැඩි ජල පරිමාවක් දැමිය හැක්කේ කුමන ජල ටැංකියට ද ? (ල. 1)

(II) (B) ටැංකියට අල්ලන මුළු ජල පරිමාව *ml* වලින් ලියන්න. (ල. 2)

(III) ටැංකි දෙකට අල්ලන ජල පරිමා අතර වෙනස *ml* වලින් දක්වන්න. (ල. 2)

06. (a) රූපයේ දැක්වෙන්නේ ලී කොටයක් දෙකට කපා වෙන් කර ගත් කොටසකි. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(I) තල පෘෂ්ඨ කොටස් ගණන කීය ද ? (ල. 1)

(II) වක්‍ර පෘෂ්ඨ කොටස් ගණන කීය ද ? (ල. 1)

(III) සරල දාර ගණන කීය ද ? (ල. 1)

(IV) වක්‍ර දාර ගණන කීය ද ? (ල. 1)

(V) ශීර්ෂ ගණන කීය ද ? (ල. 1)

(b)




(I) (b) හි දක්වා ඇති පතරොම භාවිතයෙන් පිළියෙල කර ගන්නා ඝන වස්තුව නම් කරන්න. (ල.2)

(II) එම පතරොම මගින් පිළියෙල කරන ඝන වස්තුවේ දාරයක දිග කීය ද ? (ල. 1)

(III) එම ඝන වස්තුවේ මුහුණත්, දාර සහ ශීර්ෂ සංඛ්‍යාව ලියන්න. (ල. 3)